# දරුවන් උදෙසා බයිබලයක්

# දාවිත් නම්වූ එඬේර කොලුවා



**ඉදිරිපත් කරන්නා:** Edward Hughes

**නිදර්ශනය කරන්නා:** Lazarus
Alastair Paterson

**සකස්කරන්නා:** Ruth Klassen

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා:** Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
**අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.**



බොහෝ කලකට පෙර, ඊශ්‍රායෙල්හි සාවුල් රජකළ කාලයේ, දාවිත් නම් ළමයෙකු තම සහෝදරයන් හත්දෙනාට ඔවුන්ගේ පියාගේ බැටළු රැළ බලා ගැනීමට උපකාර කළේය. ඔහු පවුලේ බාලයා වුවද, දාවිත් දෙවියන් වහන්සේට ආදරය කළ හා විශ්වාස කළ, ශක්තිමත්, නිර්භීත පිරිමි ළමයෙකු වූයේය. ඔහු ජීවත් වූයේ බෙත්ලෙහෙම් නගරයේ ය.





වරක් සිංහයෙකු රැළට පහරදී කෑම සඳහා බැටළු පැටවෙකු උදුරා ගත්තේය. තරුණ දාවිත් ප්‍රහාරකයාට පහර දුන්නේය. බැටළු පැටවා ඉවතට ඇදගෙන ගොරවන මෘගයාගේ රැවුලෙන් අල්ලා ඌ මරා දැමුවේය. දෙවියන් වහන්සේ ඔහුට උපකාර කළ බව දාවිත් දැන සිටියේය.

3



සාවුල් රජ දෙවියන් වහන්සේව මෙතරම් පහත් කොට සැළකීම ගැන දෙවියන් වහන්සේගේ අනාගතවක්තෘ සාමුවෙල් දුක් වෙමින් සිටියේය. “ඔබ සාවුල් වෙනුවෙන් කොපමණ කාලයක් වැළපෙන්නෙහිද?” දෙවියන් වහන්සේ සාමුවෙල්ට දොස් නැඟූ සේක. “මම ඔබව ජෙස්සේ වෙත යවමි. මක්නිසාද මම ඔහුගේ පුත්‍රයන් අතරින් රජෙකු සපයා ගත්තෙමි.” ජෙස්සේ දාවිත්ගේ පියාය.

4



වෙනත් රජෙකු සොයායෑම නිසා සාවුල් රජු ඔහුව මරා දැමිය හැකි බව සාමුවෙල් දැන සිටියද, අනාගතවක්තෘවරයා දෙවියන් වහන්සේට කීකරු වූයේය.

5



සාමුවෙල් පැමිණි විට, ජෙස්සේ ඔහුගේ පුතුන් හත්දෙනෙකු සාමුවෙල් ඉදිරියෙන් ගමන් කරන්නට සැළැස්වූයේය. එවිට සාමුවෙල් ජෙස්සේට කතා කොට, “සමිදාණන් වහන්සේ මොවුන්ව තෝරාගෙන නැත” යි කීවේය. ඉතිරි වූයේ බාලයා වූ දාවිත් පමණි. ඔහු බැටළුවන් බලාගනිමින් පිටත සිටියේය. ඔව්හු දාවිත් කැඳවාගෙන ආවේය. සමිදාණන් වහන්සේ කතා කොට, “නැඟිට, ඔහුව රජකමට අභිෂේක කරන්න; මක්නිසාද මේ ඒ තැනැත්තා ය"යි කීසේක.”

6

සාවුල්ගේ මාලිගාවේ දී සමිදාණන් වහන්සේගේ ආත්මය සාවුල් වෙතින් ඉවත්ව ගිය අතර ඔහු මනසින් වියවුල් මිනිසෙකු බවට පත් වූයේය. ඔහුගේ සේවකයෝ මිහිරි සංගීතයට සාවුල්ගේ මනස සන්සුන් කළ හැකි බව සිතුවෝය. ඔවුන්ගෙන් එක් අයෙක් වීණාව හොඳින් වාදනය කරන තරුණයෙකු ගැන දැන සිටියේය. ඒ තරුණයා කවුරුන් කියා ඔබට සිතාගත හැකිද? එසේය, ඒ දාවිත්ය.



7

දාවිත්ගේ සංගීතය සාවුල්ව සන්සුන් කළ අතර එය ඔහුට නිවැරදි ලෙස සිතන්නට උපකාර විය. දාවිත්ව රජුගේ සේවයේ රඳවා තබා ගැනීමට සාවුල්, ජෙස්සේගෙන් ඉල්ලා සිටියේය. සාවුල්ට මානසික ආතතිය හෝ බය ඇති වූ සෑම අවස්ථාවකම දාවිත් ඔහු වෙනුවෙන් වීණාව වාදනය කළේය. එය ඔහුගේ මනස නිරවුල් කරන්නට උපකාර විය.



8

දාවිත් ගෙදර ගිය පසු සාවුල් පිලිස්තිවරුන් සමඟ විශාල සටනක් කළේය. දාවිත්ගේ සහෝදරයන් සාවුල්ගේ හමුදාවේ සටන් කළෝය. ජෙස්සේ දාවිත්ව, ඔහුගේ සහෝදරයන්ට කෑම රැගෙන යන්නටත් ඔවුන්ගේ දුක සැප දැනගෙන එන්නටත් යුධ පෙරමුණට යැව්වේය.



9

දැවැන්ත පිලිස්ති ජාතික යෝධයෙක් වූ ගොලියත්, ඊශ්‍රායෙල් සෙබළුන්ව බියට පත් කළේය.



10

“ඔබ අතරින් මනුෂ්‍යයෙකු තෝරා, ඔහු මා වෙතට එවන්න!” ගොලියත් කෑගැසුවේය. “ඔහුට මා සමඟ සටන් කර මා මරා දැමීමට හැකි වේනම්, අපි ඔබේ සේවකයෝ වන්නෙමු. නමුත් මම ඔහුව මරා දැමුවොත්, ඔබ අපගේ මෙහෙකරුවන් වී අපට සේවය කළ යුතුය.” ඊශ්‍රායෙල්හි සියලු මනුෂ්‍යයෝ යෝධයාව දුටු විට, ඔහු වෙතින් පලා ගියෝය.



11

එවිට දාවිත් සාවුල්ට කතා කොට, “ඔහු නිසා කිසිවකුගේ සිත නොකැළඹේවා, ඔබේ මෙහෙකරුවා ගොස් මේ පිලිස්තියා සමඟ සටන් කරන්නේය,” යි කීවේය. සාවුල්ට අවශ්‍ය වූයේ දාවිත් යුධ සන්නාහ පැළඳ කඩුවක් රැගෙන යෑමටය. නමුත් ඒ වෙනුවට දාවිත් ඔහුගේ ගල්පටිය ගෙන ඔයෙන් සිනිඳු ගල් පහක් තෝරාගත්තේය.



12

තරුණ දාවිත් සන්නාහයක්වත් පැළඳ නොසිටි බව දුටු ගොලියත් සිනාසුණේය. “මම ඔබේ මාංසය අහසේ කුරුල්ලන්ටත් කෙතේ මෘගයන්ටත් දෙන්නෙමි!” ඔහු ගර්ජනා කළේය. “මම සමිඳාණන් වහන්සේගේ නාමයෙන් ඔබ වෙත එන්නෙමි!” යි දාවිත් පිළිතුරු දුන්නේය. “මෙදින සමිඳාණන් වහන්සේ ඔබව මාගේ අතට පාවා දෙනු ඇත. මක්නිසාද සටන සමිඳාණන් වහන්සේගේ ය!”



13

ඉන්පසු දාවිත් කෙලින්ම ගොලියත් දෙසට දිව ගියේය. ඔහු දිව යන විට, ඔහු තම ගල්පටියෙන් එක ගලක් විද්දේය. එය ගොලියත්ගේ නළලටම වැදුණි. ගොලියත් බිම වැටුණේය!



14

දාවිත් ඉක්මනින් ගොලියත්ගේ දැවැන්ත කඩුව ඇද ඔහුගේ හිස කපා දැමුවේය. පිලිස්තිවරු ගොලියත් මැරුණු බව දැක ඔවුන්ගේ ජීවිත බේරාගනු පිණිස දිව්වෝය.



15

මේ, වීණාවෙන් තමා සනසපු දාවිත්ම බව සාවුල් රජුට අමතක වූයේය. ඔහු තම හමුදාව භාරව දාවිත් පත් කළේය. නමුත් පසුව මිනිසුන් දාවිත්ගේ ජයග්‍රහණවලට ගෞරව කරන විට සාවුල් හට ඊර්ෂ්‍යයා සිතුනි. “දැන් ඔහුට රාජ්‍යය හැර තවත් කුමකින් අඩුවක්ද?” සාවුල් කල්පනා කළේය. සාවුල් එදා සිට දාවිත් ගැන විමසිලිමත් වූයේය.



16

නැවතත් සාවුල් රජුගේ සිත කැළඹෙන්නට විය. ඒ නිසා දාවිත් ඔහුව සනසන්නට සංගීතය වාදනය කළේය. සාවුල් තුන් වතාවක්ම දාවිත් දෙසට හෙල්ලය විසි කළේය. නමුත් දාවිත් සෑම අවස්ථාවකදීම බේරී පැන ගියේය. සාවුල් දාවිත්ට බිය වූයේය.

මන්ද සමිදාණන් වහන්සේගේ ආත්මය තමා කෙරෙන් ඉවත්ව ගියද, ඔහු සමඟ සිටින බව සාවුල් දැන සිටි නිසාය.



17

නමුත් සාවුල්ගේ පුත් ජොනතන් දාවිත්ට සහෝදරයෙකුට මෙන් ආදරය කළේය. “මගේ පියා වන සාවුල් ඔබව මරන්න උත්සාහ කරනවායැ” යි කියා ඔහු දාවිත්ට අනතුරු ඇඟෙව්වේය. එබැවින් දාවිත් පැන ගියේය. ඔහුගේ බිරිඳ ඔහුගේ ඇඳ මත පිළිරුවක් තබා, මධ්‍යම රාත්‍රියේ ජනේලයෙන් දාවිත්ව බිමට බැස්සුවාය. සාවුල්ගේ මිනිසුන් උදයේ එද්දී දාවිත් පැනගොස් තිබුණි.



18

දාවිත්ට සාවුල්ගෙන් බොහෝ ඈතට පලා යාමට සිදු විය. ඊට පෙර, ඔහු සහ ජොනතන් එක්ව ගිවිසුමක් ඇති කර ගත්තෝය. ඔවුන් සෑම විටම එකිනෙකාට උදව් කරන බවට දෙදෙනා පොරොන්දු වූවෝය.



19

කණගාටුදායක ලෙස යහළුවන් දෙදෙනා එකිනෙකාගෙන් සමුගත්තෝය. දාවිත් සාවුල්ගේ සොල්දාදුවන් ඔහුව සොයා ගනීවියැයි යන බිය නොමැතිව ජීවත් විය හැකි ස්ථානයක් සොයා ගැනීමට පිටත් වූයේය.



20

දාවිත් නම්වූ එඬේර කොලුවා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

1 සාමුවෙල් 16 -20

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130






19

60



මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජිවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)